සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 10 ශ්‍රේණිය
## සිංහල සාහිත්‍ය රසාස්වාදය

නම/විභාග අංකය :- ........................................................................ කාලය : පැය 03 යි.

❖ **සැලකිය යුතුයි:-**
**I කොටසෙහි 1, 2 ප්‍රශ්නවලටත් II කොටසෙහි 3 වැනි ප්‍රශ්නයටත් III කොටසෙහි 4, 5, 6, 7 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකකටත් උත්තර සපයන්න.**

### I කොටස

● අංක (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා ඒවා ඇසුරෙන් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(1) (i) "මේ කිමෙක් ද? මහලු බමුණකු ගෙන ගිය නිසාව මම දිවීමි"
(අ) මේ ප්‍රකාශය අසා සිටියේ කවුරුන් ද?
(ආ) මෙහි 'මම' යනුවෙන් සඳහන් වන්නේ කවුද?

(ii) "මා එක්ක තරහක් තියෙනවා නම් ගහන්ට ඕනෑ මේ කොල්ලන්ට නොවෙයි. මටයි"
(අ) මේ ප්‍රකාශය කාගේ ද?
(ආ) මේ ප්‍රකාශය කළේ කවුරුන් වෙත ද?

(iii) නපුරු සැඩට යන තට පැමිණෙන වේගය
විදුරු හොඹවයි කළු පව් පල දෙවා මිය
කමුරු වනය මුතුලිත වන බව සවිය
කවුරු විසින් වැළැකිය හැකි මෙලිය ඝන

(අ) මෙහි මුල් පද දෙකේ අර්ථය ලියන්න.
(ආ) තද කළු අකුරින් මුද්‍රිත පද දෙකේ අර්ථ වෙන වෙන ම ලියන්න.

(iv) "සිංගිරිගෙන් බත් ඉල්ලගෙන කාලා ගිලාගන්න."
(අ) මේ උද්ධෘතය උපුටාගත් පාඩමේ කතුවරයා නම් කරන්න.
(ආ) ඉහත ප්‍රකාශය කාගේ ද?

(v) "ඉරට ඉරක් ගෙන මෙහෙම ඉරක් ගැන
ඉරිදා පායන ඉර වාගේ
හැටි පැදක් ගෙන මෙහෙම සඳක් ගැන සඳුදා
පායන සඳ වාගේ"
(අ) ඉහත පද්‍යය කුමන ජනකවි වර්ගයකට අයත් ද?
(ආ) මෙම පද්‍යයේ ඉතිරි දෙපදය සම්පූර්ණ කරන්න. (ලකුණු 4 x 5 - 20)

(2) දී ඇති පද්‍ය පෙළ කියවා අසා ඇති ප්‍රශ්න උපයෝගී කොටගෙන රසාස්වාදයක් ලියන්න.

ගොහිම පුවඳ විහිදෙන පස්තුර් හිමල
උතුම් මුව හැඩෙහි හැබී බඹ ගැණ විකල
විනම් මෙමට මහබඹු පැවි යම් කල
තවම් ඔබරු කියන ද්‍රැනන්ගෙ දිව මුළු

තිරපර ගුණෙහෙත් යුතු උතුමකු හට පවර
සමුදුර සියල් කිඳුරැලෙහ තුංපෙය සුගහර
පුවතර මෙළඳුදිව මන්වෙන පිය ගෙනදර
මතු සර තොළින යැපෙනක් එබැවින් තවර

පරසිඳු පබු දැකුන් පෙට් පමණින් මගරු
බෙලෙනිඳු මද වුවත් ගොසොකරනී රුදුන් පරු
බරනිඳු ගෙල වසන හා රද ෂිඹින් ගරු
ගුරුළිඳු ඇතින් ඇපි සිම යහළු ... තොරතුරු

(i) මෙම පද්‍ය සඳහා කවියා තේමා කර ඇත්තේ කුමක් ද?
(ii) එම අත්දැකීම රසවත් ව ඉදිරිපත් කිරීම සඳහා යොදාගත් උපක්‍රම කොතෙක් දුරට උචිත වන්නේ ද?
(iii) කවියා තම අත්දැකීම් ප්‍රබලව ඉදිරිපත් කිරීම සඳහා යොදාගත් යෙදුම් දෙකක් උපුටා ලියන්න.
(iv) කවියාගේ අරමුණු ඉටු කර ගැනීමට යොදාගත් බස් වහර කොතෙක් දුරට සමත් වී ඇත් ද?
(v) පැදි පෙළ සඳහා කවියා යොදාගත් රස ජනනය කිරීම සඳහා උචිත වූවක් ද? (ලකුණු 25)

II කොටස

පහත දැක්වෙන ගද්‍ය පද්‍ය කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් උත්තර සපයන්න.

(1) "මඟුල් ගෙයක් ගත්තොත් හැ තමයි හොඳ" අම්මා කියා නිර ගමුත් පොඩි මාමා ඊට එකඟ වූයේ නැත. මෙච්චර මිනිහෙක් වෙලා මඟුලක් ගොහරින්නොත් රටේ මිනිස්සු මොනවද හිතන්නෙ.
රටේ මිනිස්සු මොනව හිතුවම මොකද රටේ මිනිස්සු යැ මම එපා යැ මීටට විපදුං කරන්ට
විපදුං කළගම මොකද ඒකටත් එක්ක හම්බ වෙන්නැතෙ. අන්න ඒකනං ඇත්ට හම්බ වෙයි. පොඩි මාමා කීය. මඟුලක් කාලා ලාබ ගන්න තැනක් කියන්ඩ පුලුවන් ද? කොහොම කළත් අන්තිමේදි ඇතින් පාඩුයි. වැඩි ඇත යන්ඩ කින්නෑ නංගිගෙ මඟුලම බලමු. ලාබ වුණා ද?
අම්මා ඊට වඩා කතා කළේ නැත. මඟුල් කන්නෙ ඉතින් ලාබ ගන්ඩමත් නෙමෙයිනෙ. කියා ඈ නිශ්ශබ්ද විය.
උඹ මොකටද නංගියෙ ඕව කියන්ඩ ගියෙ? මේ කතාව ඇසූ ලොකු මාමා අම්මාට දොස් තැගුවාය. එයා කොහොම සල්ලි පොදි බැඳගෙන ඉඳල යන කොට අරන් යන්නැතෙ. උත්සවයක් නොහත් නමුත් පොඩි මාමා මහ ගෙය අලුත්වැඩියා කළේය. බිදුළ උළු ගාවා වත්ත සුද්ද බුද්ද කරවිය.

(i) මේ පාඨයෙහි සඳහන් පරිදි මඟුල් ගෙයක් ගන්නට තීරණය කළේ කාගේ ද? (ල 05)
(ii) "පොදි බැඳගෙන ඉඳල මැරෙන කොට අරන් යන්නැතෙ" යනුවෙන් සඳහන් කෙරෙන්නේ පොඩි මාමාගේ කවර චරිත ලක්ෂණයක් ද? (ල 05)
(iii) මෙහි කියැවෙන පරිදි මඟුල් ගෙදර සඳහා පිළියෙළ කිරීමට වත්කමක් ඇත්තේ කාට ද? (ල 05)
(iv) පාඨයේ සඳහන් පරිදි පිරිමින්නගේ මව තම සහෝදරයන් කෙරෙහි දක්වන කෙනෙගතය කෙබඳු දැයි පැහැදිලි කරන්න. (ල 10)

හැකහොත්

ලස්සන හිමවතේ මා වී — පලසපන්නේ
පුස් දෙන අලි ඇතුන් පන්නා — ළඟන්නේ
රැස්මෙන දෙවියන් වෙල බත් — බුදින්නේ
උප්පත්තම හිසටි මම පැල් — රකින්නේ

බෝමු ඉඳල දළ ලා ලෙද් ගෙනා — ලාලේ
කොකටිය මලේ එක යා ලෙද් ගෙනා — යාලේ
කැලණි ගඟේ මුරු යා ලෙද් ගෙනා — පාලේ
පැපියග හතා මෙහි ඒ ලෙද් ගෙනා — ඒලේ

තන්ද උඩින් එන කිකිළිය — ගෝමරියේ
නලල් කළින් වට දුනකිය — මුතුකැටියේ
අත පාමුදු පය පාමුදු — වළිරොඩියේ
මට විටු පා ගෙට යනවද — පුරතලියේ

ඇල්ලාගෙන නෙරිය ඇතකින් කිමි ද — නාගෝ
වියා ගෙන දෙගන අතකින් කිමි ද — නාගෝ
ගිම්හයක් නැති ගමන් තනි මග කිමි ද — නාගෝ
අම්බලමේ ඉඳලා අපි යමු ද — නාගෝ

(i) මෙහි පළමු පද්‍යය කුමන ජන කාව්‍ය වර්ගයකට අයත් ද? (ල 05)

(ii) ගැමි ජන සමාජයේ පැවති ඇදහිලි හා විශ්වාස පිළිබඳ කියැවෙන පද්‍ය පාදය උපුටා ලියන්න. (ල 05)

(iii) තෙවන පද්‍යයෙන් කවියා අමතනුයේ කෙබඳු අයෙකුට දැයි දක්වන්න. (ල 05)

(iv) ජනකවියේ දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ 2 ක් පද්‍යපෙළෙන් නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ල 10)

## III කොටස

මෙම කොටසේ ප්‍රශ්න දෙකකට පමණක් උත්තර සපයන්න.
(එක් එක් උත්තරයක වචන 150ක් වත් තිබිය යුතු ය.)

(4) ළමා ලොව සුන්දර සිතුවිලි නිරූපණය කිරීමට වෙසක් පහන කෙටිකතාවෙන් මතු කර දැක්වීමට කතුවරයා පෙන්වූ සමත්කම නිදසුන් තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල 10)

(5) පාඨක පිරිසක් තුළ කතා රසය ජනිත කිරීමට කුස ජාතක කථාකරු දැක්වූ කුසලතාව නිදසුන් තුනක් දක්වමින් විමසන්න. (ල 10)

(6) සුභාෂිත කවියා තමා අවට පරිසරයේ විවිධ වස්තූන් හසුකරගෙන ඇති ආකාරය නිදසුන් තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල 10)

(7) විවිධ බාධකයන්ට මුහුණ දෙන ගැමි පවුලක හැලහැප්පීම් පිළිබඳ තුංමං හන්දිය නවකතාවෙහි සිරිසේන හා ලොකු මාමා යන චරිත දෙක ඇසුරින් විමසන්න. උචිත නිදසුන් තුනක් දක්වන්න. (ල. 10)